ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pension

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2014

# வருடாந்தச் செயல் திறன் அறிக்கை 2014

# ANNUAL PERFORMANCE REPORT 2014




විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
මාලිගාවත්ත, කොළඹ.

ஓய்வூதியத் திணைக்களம்,
மாளிகாவத்தை, கொழும்பு 10

DEPARTMENT OF PENSIONS
MALIGAWATHTHA , COLOMBO 10 .

www.pensions.gov.lk

# පටුන

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව පිළිබඳ විවරණය 3 - 7

1. ලියාපදිංචි අංශය 8 - 9

2. ගෙවීම් ප්‍රගතිය 10 - 15

3. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අංශය 15 - 16

4. පාලන හා පුහුණු අංශය 17 - 18

5. ප්‍රතිපත්ති හා නීති අංශය 19 - 20

6. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල 21

7. අභ්‍යන්තර විගණන අංශය 22

8. ගිණුම් අංශය 23 - 25


9. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව තුල විශ්‍රාමිකයන් සඳහා 2014 වර්ෂය තුල සිදු කරන ලද වෙනස්කම් 26 - 27

10. ජාතික විශ්‍රාමික දිනය - 2014 27 - 28

11. රම්බොඩ නිවාඩු නිකේතනය 29

12. කැලණිය වෙදමුල්ල නිවාඩු නිකේතනය 30

13. විසර්ජන ගිණුම 31 - 37




වි.වැ.නි - විශ්‍රාම වැටුප් නිලධාරී
අ.ස - අයවැය සහකාර
ලේ.ස - ලේඛණ සහකාර
කා.සේ.සේ. - කාර්යාල සේවක සේවය

ස.නි - සංවර්ධන නිලධාරී
රා.ක.ස - රාජ්‍ය කළමනාකරණ සහකාර
තො.තා.නි. - තොරතුරු තාක්ෂණ නිලධාරී
බ.භා. - බංගලා භාරකරු

ශ්‍රී ලංකා විශ්‍රාම වැටුප් Sri Lanka Pensions

**විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව - අනුමත කාර්ය මණ්ඩලය**

| තනතුරේ ස්වභාවය | තනතුර | අදාළ වන සේවය | වැටුප් ක්‍රමය | අනුමත මුළු තනතුරු සංඛ්‍යාව | සේවයේ නියුතු සංඛ්‍යාව | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් | SLAS (Special) | SL 3 | 01 | 01 | - |
| | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ | SLAS (Class I) | SL 1 | 03 | 03 | - |
| | ප්‍රධාන ගණකාධිකාරී | SLAcS (Class I) | SL 1 | 01 | 01 | - |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ | SLAS (Class II or III) | SL 3 | 07 | 07 | - |
| | ගණකාධිකාරී | SLAcS (Class II or III) | SL 4 | 09 | 06 | 03 |
| | නි.අ/ස.අ. | SLICT Service II/ III | SL 5 | 01 | - | 01 |
| | නීති නිලධාරී | Dept | SL 6 | 01 | - | 01 |
| තෘතීය මට්ටම | පරිපාලන නිලධාරී | PMAS (Supra) | MN 7 | 04 | 04 | - |
| | භාෂා පරිවර්තක | TS | MN 6 | 02 | 01 | 01 |
| | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | SLICT Service | MN 6 | 05 | | 05 |
| ද්විතීය මට්ටම | අයවැය සහකාර | Related Service | MN 4 | 01 | 01 | |
| | විශ්‍රාම වැටුප් නිලධාරී | Related Service | MN 4 | 340 | 306 | 34 |
| | කාර්මික නිලධාරී | SLTS | MN 3 | 01 | - | 01 |
| | රාජ්‍ය කළමනාකරණ සහකාර | PMAS | MN 2 | 190 | 107 | 83 |
| | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | SLICT Service | MT 1 | 05 | - | 05 |
| | සංවර්ධන නිලධාරී | D/O | MN 4 | 398 | 325 | 73 |
| | ලේඛන සහකාර | Dept | MN 1 | 141 | 135 | 6 |
| ප්‍රාථමික මට්ටම | බංගලා භාරකරු | Dept | PL 1 | 02 | 01 | 01 |
| | අරක්කැමි/උද්‍යාන කම්කරු | Dept | PL 2 | 04 | 04 | - |
| | රියදුරු | D/S | PL 3 | 12 | 11 | 01 |
| | කාර්යාල කාර්ය සහයක | KKS | PL 1 | 56 | 50 | 06 |

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

## දැක්ම

ආර්ථික හා සාමාජීය වශයෙන්

තෘප්තිමත් විශ්‍රාමික ප්‍රජාවක් බිහි කිරීම

## මෙහෙවර

රාජ්‍ය සේවය සඳහා උරදුන් නිලධාරීන්ගේ

සේවා අවසාන ප්‍රතිලාභ සහතික කිරීම තුලින්

ඔවුන්ගේ විශ්‍රාමික ජීවන තත්ත්වය නඟා සිටුවීම හා

පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය

සක්‍රීය දායකත්වය නිබඳව ලබා දීම.

## අරමුණ

විශ්‍රාමික රජයේ නිලධාරීන් සහ

ඔවුන්ගේ ප්‍රතිලාභීන් සඳහා

ශක්තිමත් ආරක්ෂණ ව්‍යුහයක් සැපයීම.

# විශ්‍රාමික ගෙවීම් කටයුතු පිළිබඳ විවරණය

ශ්‍රී ලංකාවේ සමාජ සත්කාර සේවාවේ ප්‍රමුඛයා වන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වසර 115ක ඉතිහාසයක් සමරයි. මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යය වන්නේ දැනට විශ්‍රාම ලබා ඇති 560,000කට ආසන්න වන විශ්‍රාමික ප්‍රජාවගේ විශ්‍රාම ගෙවීමත්, ඔවුන්ගේ සමාජ සංවර්ධනයට අවශ්‍ය වැඩසටහන් හඳුනා ගනිමින් ඔවුන් නැවත සමාජයේ ක්‍රියාශීලී සමාජ කණ්ඩායම් බවට පත් කරලීමට අවශ්‍ය කටයුතු කිරීමයි. තව ද දැනට රාජ්‍ය සේවයේ සිටින අනාගතයේ විශ්‍රාම ගැනීමට බලාපොරොත්තු වන ලක්ෂ 15කට ආසන්න සියළුම රාජ්‍ය සේවකයන්ගේ හා ත්‍රිවිධ හමුදාවේ සේවය කරන සියළුම හමුදා නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් අවශ්‍යතා සුරකිමින් ඔවුන් විශ්‍රාම වැටුප් ලබන මොහොතේ දී එම විශ්‍රාම වැටුප් පිළිගැන්වීමට අවශ්‍ය කළමනාකරණ හා ප්‍රතිපත්තිමය කටයුතු කිරීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීමයි.

## ❖ දෙපාර්තමේන්තුවේ දිශානතිය වෙනස් කිරීම.

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ දිශානතිය වෙනස් කරන ලද වසර ලෙස 2014 වසර හඳුන්වා දිය හැකිය. එනම් මෙම වසර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ප්‍රතිපත්තිමය හා කළමනාකරණ කටයුතුවල දැවැන්ත පරිවර්ථනයකට මුල පුරන ලද වසර වේ. මේ අනුව රාජ්‍ය සේවකයින් විශ්‍රාම ගැන්වීම සඳහා සම්බන්ධ වන 3000කට ආසන්න ආයතන සමඟ සෘජුවම ගණුදෙනු කරමින්, ඔවුන්ව දැනුවත් කරමින් හා අදාල බලතල පවරා ඔවුන්ව ශක්තිමත් කරමින්, විශ්‍රාමිකයා හා විශ්‍රාම වැටුපේ වටිනාකම පිළිබඳව එම ආයතන තුල පැවති ආකල්ප ධනාත්මක ලෙස වර්ධනය කිරීම සඳහා වැඩසටහන් රාශියක් පවත්වන ලද අතර ඒ තුළින් විශ්‍රාම වැටුප් ක්‍රියාවලියේ පැවති මන්දගාමී තත්වය නැති කර නව ජීවයක් ලබා දීමට කටයුතු කරන ලදි. මේ සඳහා අවශ්‍ය උපදෙස්, මඟපෙන්වීම හා චක්‍රලේඛ රාශියක් නිකුත් කිරීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව කටයුතු කරන ලද අතර එහි ප්‍රතිපලයක් ලෙස විශ්‍රාම වැටුප් ක්‍රියාවලියේ සක්‍රීය කොටස්කරුවන් බවට එම ආයතන පත් කර ගැනීමට අපට හැකි විය.

## ❖ ප්‍රාදේශීය ලේකම් කාර්යාල දැනුවත් කිරීම.

විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා දායක වන දිස්ත්‍රික් ලේකම් කාර්යාල ජාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල ජාලය සක්‍රීය කිරීම සඳහා විවිධ වූ වැඩසටහන් ජාලයක් ක්‍රියාත්මක කරන ලදි. මෙහි මූලික අරමුණ වූයේ විශ්‍රාම වැටුප් හිමිකම නොමැති පුද්ගලයන්ට විශ්‍රාම වැටුප් ගෙවීම වැනි මූල්‍ය අවභාවිතයන් හා විශ්‍රාම වැටුප් ගෙවීමේ දී සිදුවන අනිකුත් මූල්‍ය අක්‍රමිකතා සම්පූර්ණයෙන් ම නවතාලීම සඳහා ඔවුන්ගේ වගවීම ඉහල නැංවීමට කටයුතු කිරීමයි. මේ සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමඟ සෘජුවම සම්බන්ධ වී ඔවුන් දැනුවත් කිරීමට කටයුතු කරන ලදි.

## ❖ ආර්ථිකය ශක්තිමත් කිරීම.

දැනට විශ්‍රාම ලබා සිටින ජ්‍යෙෂ්ඨ පුරවැසියන් හා විශ්‍රාමික සංවිධාන 600කට පමණ ඒකරාශී වී සිටින විශ්‍රාමික ප්‍රජාව සමඟ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ක්‍රියාත්මක වී අන්‍යොන්‍ය ලෙස බැඳීම වර්ධනය කර ගනිමින් යහපත් ද්විගනුදෙනුවක් පවත්වා විශ්‍රාමික ප්‍රජාව නැවත ප්‍රකෘතිමත් කර මෙරටට ඉතා වටිනා පිරිසක් බවට පත් කිරීමට කටයුතු කරන ලදි. තව ද පෞද්ගලික අංශය සමඟ සම්බන්ධ වී විශ්‍රාමික ප්‍රජාව නැවතත් මෙරටේ පිළිගත් කණ්ඩායමක් බවට පත් කිරීමේ වැඩසටහන් මාලාවේ ආරම්භය ද 2014 වසරේ දී සිදු විය. එහි මූලික පියවර ලෙස රාජ්‍ය සේවයේ සිට විශ්‍රාම ගිය විශ්‍රාමික පුරවැසියෙකුට කිසිදු මූල්‍ය ආයතනයකින් මූල්‍ය පහසුකම් නැතහොත් ණය මුදලක් ලබා ගැනීම සඳහා තිබූ බාධාවන් ඉවත් කර දමන ලදි. මෙම දැවැන්ත වැඩසටහනේ ආරම්භය සඳහා පැන්ෂියා බැංකුව තම නොමසුරු දායකත්වය ලබා දෙන ලදි. අද වන විට මෙම වැඩසටහන සඳහා රාජ්‍ය හා පෞද්ගලික බැංකු රාශියක් තම දායකත්වය ලබා දී ඇත. මෙම වැඩසටහන මඟින් විශ්‍රාමිකයා, විශ්‍රාමිකයාගේ පවුල් ඒකකය සහ සමස්ථ විශ්‍රාමික ප්‍රජාවේ ආර්ථිකය ඉහල නැංවීමට උපකාරී විය. 2014 වසර තුළ දී මෙම වැඩසටහනට සහභාගි වූ විශ්‍රාමික ප්‍රජාව වෙනුවෙන් මෙම වානිජ බැංකු විසින් රුපියල් බිලියන 25කට ආසන්න මූල්‍ය පහසුකම් සපයා ඇත.

## ❖ වෛද්‍ය රක්ෂණ ක්‍රමය

රාජ්‍ය සේවකයින්ට තම සේවයේ යෙදී සිටින කාලය තුළ දී අග්‍රහාර රක්ෂණ ක්‍රමය භුක්ති විදීමට අවස්ථාව උදා වේ. මේ ආකාරයේ රක්ෂණ ක්‍රමයක් විශ්‍රාමිකයන්ට ද හඳුන්වා දෙන ලෙස ඉල්ලා විශ්‍රාමික ප්‍රජාව හා විවිධ විශ්‍රාමික සංගම් මඟින් නිරන්තරයෙන් රජයෙන් ඉල්ලීම් කර ඇත. එම ඉල්ලීම්වලට විකල්පයක් ලෙස විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට පුද්ගලික අංශය සමඟ සම්බන්ධ වී ශ්‍රී ලාංකීය විශ්‍රාමික ප්‍රජාව වෙත ඉතාම අඩු වාරික ක්‍රමයකට “බුහුමන්” නමින් වෛද්‍ය රක්ෂණ වැඩසටහනක් හඳුන්වා දීමට හැකි විය. මෙය රජයක් ලෙස විශ්‍රාමික ප්‍රජාවට ඉටු කල විශාල යුතුකමක් ලෙස දැක්විය හැක.

## ❖ ජාතික විශ්‍රාමික දිනය

විශ්‍රාමික ප්‍රජාව තම විශ්‍රාමික ඉල්ලීම් හා අයිතිවාසිකම් පිළිබඳව පමණක්ම පෙළ ගැසී සිටින අවධියක රටේ පුරවැසියන් ලෙස ඔවුන්ගෙන් ඉටු විය යුතු යුතුකම් පිළිබඳව දැනුවත් කර, ඒ සඳහා විශ්‍රාමික ප්‍රජාව සජීවීව දායක කර ගැනීම සඳහා 2014 වසරේ දී විශ්‍රාමික දිනය භාවිත කිරීමට හැකි විය. 2014 වසරේ දී ප්‍රථම වරට විශ්‍රාමික දිනය ජාතික මට්ටමින් පවත්වන ලද අතර මෙහි දී විශ්‍රාමික ප්‍රජාව පිළිබඳව සමාජයේ නැවත අවබෝධයක් ඇති කරලීමට හා විශ්‍රාමික ප්‍රජාව සමාජයේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් ලෙස ඉටු කල යුතු යුතුකම් පිළිබඳව අවබෝධ ගැන්වීම සිදු කරන ලදි.

### ❖ පාරිතෝෂිකය කඩිනම් කිරීම

2014 වසර මුලදී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව පිළිබඳව විශ්‍රාමික ප්‍රජාව තුළ මෙන්ම රාජ්‍ය සේවකයින් තුළද පැවති ප්‍රධාන ගැටළුව නම් 15000ක පමණ වන විශ්‍රාමික පාරිතෝෂික ප්‍රමාණයක් ගෙවීම හිඟව පැවතීමයි. මෙම ගැටළුව පිළිබඳව මහා භාණ්ඩාගාරයත් සමඟ සිදුකරන ලද සාකච්ඡාවල ප්‍රතිඵලයක් ලෙස 2014 අප්‍රේල් මාසය වනවිට විකල්ප විසඳුමක් ලබා ගැනීමට හැකිවිය. එනම් 15000ක් පමණ වූ හිඟ විශ්‍රාමික පාරිතෝෂික මුදල් ගෙවීම සඳහා රජයේ බැංකුවල අනුග්‍රහය ලබාගැනීමට හැකිවීමයි. මෙය සමස්ත ශ්‍රී ලාංකික විශ්‍රාමික ප්‍රජාව මෙන්ම, අනාගතයේ විශ්‍රාම ලැබීමට බලාපොරොත්තු වන සමස්ත රාජ්‍ය සේවකයින් ද ලබා ගන්නා ලද ජයග්‍රහණයක් ලෙස ද දැක්විය හැකිය. මෙහි ප්‍රතිඵලය ලෙස විශ්‍රාමික පාරිතෝෂික මුදල ලබාගැනීම සඳහා පොරොත්තු ලේඛනයේ සිටි 15000ක පමණ විශ්‍රාමිකයින්ගේ සියළුම පාරිතෝෂික මුදල් 2014 ජූනි මාසය වනවිට ගෙවා නිම කිරීමට හැකිවිය. ඒ අනුව 2014 ජූලි මස සිට විශ්‍රාම ගන්නා ලද රාජ්‍ය සේවකයින්ට හිමි විශ්‍රාම වැටුප හා විශ්‍රාම පාරිතෝෂිකය ඔවුන් විශ්‍රාම ගන්නා ලද මොහොතේ සිටම ගෙවීමට හැකිවිය. මෙය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ලද දැවැන්ත ජයග්‍රහණයක් ලෙස දැක්විය හැක.

### ❖ ගෙවීම් මධ්‍යගත කිරීම

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට පාලනය කළයුතුව තිබූ විශාලතම ගැටළුව නම්, මාසික විශ්‍රාම වැටුප් ගෙවීමේදී සිදුවන මූල්‍ය අක්‍රමිකතාවයන් හා මූල්‍ය නාස්තිය නවතාලීමයි. එනම් මාසික විශ්‍රාම වැටුප ගෙවීමේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 331ට අමතරව වාණිජ බැංකු ජාලය හා තැපැල් කාර්යාල ජාලය සමග සම්බන්ධ වී කටයුතු කිරීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට සිදුවිය. මෙම ක්‍රියාවලියේදී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට මුහුණදීමට සිදු වූ මූලික ගැටළු අතර, කාලය අපතේ යෑම, අනවශ්‍ය පරිදි රජයේ මුදල් කාන්දුවීම සහ පුනරාවර්තන වියදම් අසාමාන්‍ය ලෙස ඉහළ යෑම දැකිය හැකි විය. මෙම සියළු ගැටළුවලට විසඳුම් ලබාදීම පිණිස මාසික විශ්‍රාම වැටුප් ගෙවීම මධ්‍යගත කිරීම ආරම්භ කිරීම 2014 වසරේදී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් ගනු ලැබූ වැදගත්ම පියවරකි. විමධ්‍යගත ක්‍රමවේදයට මාසික විශ්‍රාම වැටුප ගෙවීමේදී විශ්‍රාම වැටුප ගෙවන්නේ කාටද? කොපමණ මුදලක් ද සහ එම මුදල කොපමණදුරට නිවැරදි ද යන්න පිළිබඳව නිසි වගවීමකින් තොරව අන්ධ ක්‍රමවේදයක් අනුගමනය කර ඇති බව පැහැදිලි කරුණකි. නමුත් 2014 ඔක්තෝබර් මස සිට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කරන ලද මධ්‍යගත ක්‍රමවේදය තුළින්, මාසික විශ්‍රාම වැටුප් ගෙවීම පිළිබඳව නිවැරදිවම සහතික කරගැනීමට හැකි වූ අතර, මේ වනවිට එහි වාසිදායක ප්‍රතිඵල දෙපාර්තමේන්තුවට මෙන්ම රජයට ලබාදීමට හැකි වී ඇත.

### ❖ විගණනය ශක්තිමත් කිරීම

2014 වසරේදී ගත හැකි වූ තවත් වැදගත් පියවරක් නම් මාසික විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රියාවලියේදී මූල්‍ය වංචා, දූෂණ හා අක්‍රමිකතා සිදුකරන ලද රජයේ නිලධාරීන් මෙන්ම විශ්‍රාමිකයින් ද නීතියේ රැහැනට හසුකකර ගැනීමට හැකිවීමයි. මේ වන විට ඔවුනට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. මෙම ක්‍රියාමාර්ගවලට යොමුවීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට හැකිවීමට හේතු සාධක ලෙස දැකිය හැකිවූයේ දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු මෙන්ම රජයේ විගණන කටයුතු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම නිසාවෙනි.

### ❖ විශ්‍රාම වැටුපට නව ජීවයක්

එනම් මෙම වසර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ප්‍රතිපත්තිමය හා කළමනාකරණ කටයුතුවල දැවැන්ත පරිවර්තනයකට මුලපුරන ලද වසර වේ. මේ අනුව රාජ්‍ය සේවකයින් විශ්‍රාම ගැන්වීම සඳහා සම්බන්ධ වන 3000කට ආසන්න ආයතන සමග ඍජුවම ගණුදෙනු කරමින්, ඔවුන්ව ශක්තිමත් කරමින්, විශ්‍රාමිකයා හා විශ්‍රාම වැටුපේ වටිනාකම පිළිබඳව එම ආයතන තුළ පැවති ආකල්ප ධනාත්මක ලෙස වර්ධනය කිරීම සඳහා වැඩසටහන් රාශියක් පවත්වන ලද අතර, ඒ තුළින් විශ්‍රාම වැටුප් ක්‍රියාවලියේ පැවති මන්දගාමී තත්ත්වය නැති කර, නව ජීවයක් ලබාදීමට කටයුතු කරන ලදී. මේ සඳහා අවශ්‍ය උපදෙස්, මගපෙන්වීම හා චක්‍රලේඛ රාශියක් නිකුත් කිරීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව කටයුතු කරන ලද අතර, එහි ප්‍රතිඵලයක් ලෙස විශ්‍රාම වැටුප් ක්‍රියාවලියේ සක්‍රීය කොටස්කරුවන් බවට එම ආයතන පත් කරගැනීමට අපට හැකිවිය.

2014 වසරේදී ගනු ලැබූ මෙම වැදගත් පියවරයන් තුළින් විශ්‍රාම වැටුප පිළිබඳව සමස්ත රාජ්‍ය සේවාව තුළ පැවති, අනාගතයේදී තම විශ්‍රාම වැටුප ලැබේවිදෝ යන සැකය දුරු කර දැමීමට හැකි වූ අතර, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව පිළිබඳව සමස්ත ප්‍රජාව තුළම පැවති බිය දුරු කරදැමීමට හැකි විය.

### ❖ පරිගණක ජාලකරණය

තවද, මෙම දෙපාර්තමේන්තුව මගින් ආරම්භ කරන ලද ඊ-පෙන්ෂන් ව්‍යාපෘතිය මේ වනවිට අකර්මන්‍ය වුවද, දෙපාර්තමේන්තුවේ සම්පත් භාවිතා කර එම පරිගණක ජාලය නැවත ක්‍රියාකාරී තත්ත්වයට පත්කිරීමට හැකිවිය. මෙම ජාලය තවදුරටත් ව්‍යාප්ත කර අනාගතයේදී විශ්‍රාමික ප්‍රජාව සමග ජාලගත කිරීම ආරම්භ කිරීමට දෙපාර්තමේන්තුව අපේක්ෂා කරයි.

### ❖ ආකර්ශනීය නිවාඩු නිකේතන

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අයත් කැලණිය, වෙදමුල්ල විශ්‍රාමික නිවාඩු නිකේතනය කාලයක් තිස්සේ අවභාවිතයට ලක්ව ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයක පැවති අතර, වර්තමනය වන විට එම නිවාඩු නිකේතනය නැවත ප්‍රකෘතිමත් තත්ත්වයට පත් කොට, විවිධ වෙනස්කම් රාශියක් සිදුකරමින්, විශ්‍රාමිකයාට වඩා හිතකර, ආකර්ශණීය පරිසරයක් ඇති කර, ඔවුන්ට නවාතැන් පහසුකම් මෙන්ම, විවිධ රැස්වීම් හා වැඩසටහන් පැවැත්විය හැකි ආකාරයට පත් කර ඇත. මීට අමතරව, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අයත්, ඉතා ආකර්ශණීය ස්වාභාවික පරිසරයක් තුළ පිහිටි නවතම නිවාඩු නිකේතනය වන රම්බොඩ විශ්‍රාමික නිවාඩු නිකේතනය 2014.06.20 දින විවෘත කරන ලදි. මෙම නිවාඩු නිකේතනය විශ්‍රාමිකයන්ගේ ප්‍රයෝජනය සඳහා මෙන්ම, අනිකුත් රාජ්‍ය සේවකයින්ටද ප්‍රයෝජනයට ගැනීමට සැලැස්වීම තුළ රජයට ආදායම් රැස්කර දීමට ද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට හැකි වී ඇත.

❖ **මානව සම්පත් අභිවර්ධනය**

2014 වර්ෂයේ දී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා විවිධ පුහුණු වැඩසටහන් පැවැත්වීම තුළ, ඔවුන්ට දෙපාර්තමේන්තුවට අයත් කාර්යභාරය හා දෙපාර්තමේන්තුවට පැමිණෙන විශ්‍රාමිකයන්ගේ සේවාවන් සුහද, කාර්යක්ෂම හා කඩිනමින් ඉටු කර දීම සඳහා විශේෂ පුහුණුවක් ලබා දෙන ලදි. එමෙන්ම, ප්‍රථම වතාවට විශ්‍රාම වැටුප් නිලධාරීන් පිරිසකට විදේශ පුහුණුවක් ලබා දීමට හැකිවීම ද දෙපාර්තමේන්තුව ලද ජයග්‍රහණයක් ලෙස සැලකිය හැකිය. මෙම පුහුණු වැඩසටහන් ලබා දීමේ පරමාර්ථය වන්නේ දෙපාර්තමේන්තුවේ මානව සම්පතින් කාර්යක්ෂම සහ ඵලදායී සේවාවක් ලබා දීම තුළ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන කාර්යභාරය රාජ්‍ය සේවාවේ ඉදිරියෙන් පවතින ආයතනයක් බවට පත් කිරීමයි.

❖ **සම්පත් සංවර්ධනය**

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව තුළ ආයතනික වශයෙන් පැවති නාස්තියක් ලෙස දැක්විය හැකි ජලය, විදුලිය මෙන්ම දුරකථන භාවිතය 2014 වර්ෂය තුල දී කැපී පෙනෙන ලෙස අඩු කිරීමට ද හැකිවිම තුළින් ඒ සඳහා පෙර වර්ෂ වලදී වැය වූ මුදල් ඉතිරි කරගැනීමට දෙපාර්තමේනුත්වට හැකි වී ඇත. මෙම ඉතිරි කර ගත් මුදල් දෙපාර්තමේන්තුවේ නවීකරණ කටයුතු මෙන්ම, වෙනත් ආයෝජන ව්‍යාපෘතීන් හි යෙදවීම තුළ රජයේ ආදායමට දායකත්වයක් ලබා දීමට ද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට හැකි වී ඇත.


2014 වර්ෂයේ දී මෙම සාර්ථකත්වය ළඟා කර ගැනීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට මූලික වශයෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් ලැබුණු සහයෝගය අගය කළ යුතුය. ඊට අමතරව අනිකුත් රාජ්‍ය හා පෞද්ගලික ආයතන මඟින් ද ලැබුණු සහයෝගය තුළ මෙම සාර්ථකත්වය ළඟා කර ගැනීමට හැකි වූ බව ද ගෞරවයෙන් සිහිපත් කළ යුතුය.

ඒ අනුව 2014 වසරේ ආරම්භ කරන ලද "විශ්‍රාම ප්‍රජාවට අලුත් ඉරක්" නමැති තේමාව යටතේ අනාගතයේ විශ්‍රාම යනු ලබන විශ්‍රාමිකයින් සඳහා දැනට ගෙවනු ලබන විශ්‍රාම වැටුපට අමතරව Pension+ සංකල්පය යටතේ ආරම්භ කරන ලද අගය එකතු කරන ලද ප්‍රතිලාභයන් විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම දිවිය වඩාත් සැපවත් කිරීමට තුඩු දී ඇති බව කිව හැක.

මෙය 2014 වර්ෂයෙන් පමණක් අවසන් නොවන වසරින් වසර තව තවත් ප්‍රතිලාභ එක් කරමින් ප්‍රසාරණය වන්නා වූ වැඩසටහනක මූලික පියවරකි.

## 1. ලියාපදිංචි අංශය

විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලියේ ප්‍රථම පියවර වන විශ්‍රාමිකයන් ලියාපදිංචි කිරිම සඳහා ක්‍රියාවලියේම මූලාරම්භක ස්ථානය ලෙස **ලියාපදිංචි අංශය ක්‍රියා** කරයි. සියළුම විශ්‍රාම ලබන නිලධාරීන්ගේ අයදුම්පත් පරීක්ෂා කිරීම, ලියාපදිංචි කිරීම සහ විශ්‍රාම වැටුප් අංක ලබා දීම ලියාපදිංචි අංශය මඟින් සිදු කරයි.





ප්‍රස්තාර 01 විශ්‍රාම වැටුප් ලියාපදිංචි කිරීම් - 2014

මූලාශ්‍රය - ලියාපදිංචි අංශය

### 1.1 ප්‍රථම විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය

2014.10.01 දින සිට 14/2014 චක්‍රලේඛණය යටතේ ප්‍රථම විශ්‍රාම වැටුප් ගෙවීම් කටයුතු ලියාපදිංචි අංශයෙන් ආරම්භ විය. පෙර තිබූ ගෙවීම් ක්‍රියාවලියේ අනුව අදාල ආයතනය මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ගොනුව යැවීමෙන් පසු එහි අඩුපාඩු පරීක්ෂා කිරීමට වැඩි කාලයක් වැය කිරීම සහ ගෙවිය යුතු හිඟ මුදල් ප්‍රමාණය ඉහල යාම නිසා ගෙවීම් කටයුතු ප්‍රමාද විය. නමුත් ප්‍රථම ගෙවීමේ ක්‍රියාවලිය ආරම්භ වීමෙන් පසු නිලධාරියා විශ්‍රාම ගත් දින පටන්ම විශ්‍රාම වැටුප ලබා ගැනීමට හැකි අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යොමු නොකර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ගොනුව ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ. නව විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය සඳහා විශ්‍රාමිකයාගේ සඳහා බැංකු ගිනුම සහ අදාල ආයතනය මඟින් විශ්‍රාම වැටුප් අනුමත ලියුම පමණක් ගෙවීම සඳහා ප්‍රමාණවත් ය.





ප්‍රස්තාර 02 ගෙවීමට යොමු කළ අයදුම්පත්‍ර

මූලාශ්‍රය - ලියාපදිංචි අංශය

### 1.2 සන්නද්ධ සේවා විශ්‍රාම වැටුප්

ත්‍රිවිධ හමුදා නිලධාරීන් හා හමුදා සේවයට අදාල සෙසු නිලයන් හි විශ්‍රාම වැටුප් පිළිබඳ සියළු කටයුතු කළමනාකරණය සහ ඔවුන්ගේ විශ්‍රාම වැටුප් ගණනය කර ගෙවීම් කිරීම මෙම අංශයෙහි ප්‍රධාන කාර්යය භාරයයි. 1949.10.10 දින නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය මගින් යුධ හමුදා නිත්‍ය සේවාවන්ට අදාල නිලධාරීන් හට හා සෙසු නිලයන්ට විශ්‍රාම වැටුප් හිමිකම ලබා දෙන ලදි. එම හිමිකම ස්වේච්ඡා බල සේනා නිලධාරීන්/ සෙසු නිලයන්, හමුදා නිලධාරිනියන් හා සෙබලියන් හට ලබා දෙන ලද්දේ 1981.09.01 නිකුත් කරන ලද යුධ හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහය මගිනි. ඉහත ව්‍යවස්ථා සංග්‍රහයන් හා වරින් වර නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් චක්‍රලේඛ පාදක කර ගනිමින් සන්නද්ධ සේවා විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය පවත්වාගෙන යනු ලබයි.




ප්‍රස්තාර 03 සන්නද්ධ සේවා ලියාපදිංචි කිරීම - 2014

මූලාශ්‍රය - ලියාපදිංචි අංශය


## 2. විශ්‍රාම වැටුප් ගෙවීම් ප්‍රගතිය

### විශ්‍රාම වැටුප් ගෙවීම - විශ්‍රාමික වර්ගීකරණය අනුව 2014

| විශ්‍රාමික වර්ගීකරණය | විශ්‍රාමිකයින් | ගෙවූ මුදල |
|---|---|---|
| සිවිල් | 337,105 | 79,444,482,364.54 |
| වැන්දඹු හා අනත්දරු | 145,261 | 22,606,187,860.00 |
| හමුදා | 54,254 | 14,622,139,869.63 |
| පුද්ගලික පාසැල්/පිරිවෙන් ගුරුවරු | 4,055 | 1,018,691,653.27 |
| පළාත් පාලන | 5,704 | 884,598,278.72 |
| එකතුව | 546,379 | 118,576,100,026.16 |


වගුව 01 - විශ්‍රාම වැටුප් ගෙවීම - විශ්‍රාමික වර්ගීකරණය අනුව 2014

මූලාශ්‍රය - ගිණුම් අංශය





ප්‍රස්තාර 04 විශ්‍රාමික වර්ගීකරණය අනුව විශ්‍රාමිකයන් - 2014

මූලාශ්‍රය - ගිණුම් අංශය





ප්‍රස්තාර - 05 විශ්‍රාම වැටුප් ගෙවීම

මූලාශ්‍රය - ගිණුම් අංශය





ප්‍රස්තාර - 06 විශ්‍රාම පාරිතෝෂික ගෙවීම - 2014

මූලාශ්‍රය - ගිණුම් අංශය




ප්‍රස්තාර - 07 විශ්‍රාම වැටුප් ගෙවීම මූල්‍ය ආයතන අනුව - 2014


මූලාශ්‍රය - ගිණුම් අංශය





ප්‍රස්තාර - 08 විශ්‍රාමික වර්ගීකරණය අනුව විශ්‍රාම වැටුප් ගෙවීම - 2014

මූලාශ්‍රය - ගිණුම් අංශය

## දිස්ත්‍රික්කය අනුව විශ්‍රාමිකයින් – 2014




## දිස්ත්‍රික්කය අනුව විශ්‍රාම වැටුප් ගෙවූ ප්‍රමාණය – 2014



## 2.1 විදේශ විශ්‍රාම වැටුප් ගෙවීම්

විදේශ රටක පුරවැසිභාවය හිමි හෝ විදේශ රටක ස්ථිර පදිංචිය ඇති හෝ වසරකට වඩා වැඩි කාලයක් මැදපෙරදිග රටවල හැර අනිකුත් රටවල වාසය කරන ශ්‍රී ලාංකීය විශ්‍රාමික ප්‍රජාවගේ මාසික විශ්‍රාම වැටුප, වැන්දඹු හා වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප සහ අනත්දරු ගෙවීම් ඇතුළු අනිකුත් ප්‍රතිලාභ ගෙවීම් අඛණ්ඩව හා නිවැරදිව ලබා දීම විදේශ විශ්‍රාම වැටුප් අංශයේ මූලික අභිප්‍රාය වේ.





ප්‍රස්තාර - 09 විශ්‍රාමිකයන් සංඛ්‍යාව

මූලාශ්‍රය - විදේශ විශ්‍රාම වැටුප් අංශය

## 3. වැන්දඹු, වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අංශය


විශ්‍රාම වැටුප් හිමි තනතුරු දරනු ලබන වැන්දඹු/ වැන්දඹු පුරුෂ ක්‍රමයට දායක වූ රාජ්‍ය නිලධාරීන් හෝ නිලධාරිනියන් මිය යෑමෙන් පසු ඔහුගේ හෝ ඇයගේ කලත්‍රයාට, අනත්දරුවන්ට සහ ආබාධිත අනත්දරුවන්ට මාසික විශ්‍රාම වැටුපක් ගෙවීම වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රියාවලිය මඟින් සිදු වේ. වැන්දඹු, වැන්දඹු පුරුෂ, අනත්දරු, ආබාධිත පුද්ගලයින් සඳහා මෙ යටතේ ගෙවීම් හිමි වේ. 2014 වර්ෂයේ දී පැවැත්වූ ජංගම සේවා මඟින් වැන්දඹු, වැන්දඹු පුරුෂ ලියාපදිංචි අංක ලබා දීමට හැකි විය.




ප්‍රස්ථාර - 10 වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ලියාපදිංචි කිරීම - 2014

මූලාශ්‍රය - වැන්දඹු හා අනත්දරු අංශය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ වැන්දඹු හා අනත්දරු අරමුදල සඳහා රුපියල් මිලියන 5,558ක මුදලක් පළාත් සභා ආයතන වලින් ද රුපියල් මිලියන 9,376ක මුදලක් මධ්‍යම රජයේ ආයතන වලින් ද ලැබී ඇත. ඒ අනුව 2014 වසරේ දී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ලැබුනු මුළු වැන්දඹු හා අනත්දරු දායක මුදල රුපියල් මිලියන 14,934කි.




ප්‍රස්ථාර - 11 වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ලියාපදිංචි කිරීම - 2014

මූලාශ්‍රය - වැන්දඹු හා අනත්දරු අංශය

## 4. පාලන හා පුහුණු අංශය

විශ්‍රාම වැටුප් ගෙවීම් පද්ධතියේ පැවති හඳුනාගත් දුර්වලතා ඉවත් කර නවීකරණය කරන ලද විශ්‍රාම වැටුප් ගෙවීම් පද්ධතියේ 9.4 සංස්කරණය හා අත්පොත හඳුන්වාදීම සඳහා විශ්‍රාම වැටුප් ගෙවනු ලබන සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක්ම ආවරණය වන පරිදි දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25කදී දැනුවත් කිරීම් වැඩසටහන් පවත්වන ලදී.

විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලියේ කඩිනම් කිරීමේ අරමුණෙන් නිකුත් කළ 14/2014 චක්‍රලේඛය හා ඉදිරි පියවරයන් දැනුවත් කිරීම සඳහා රාජ්‍ය අමාත්‍යාංශ සියල්ලම ආවරණය කරමින් අතිරේක ලේකම්වරුන් ද, පළාත් සභා හා පළාත් පාලන ආයතනවල පරිපාලනය හා සම්බන්ධ නිලධාරීන් ද දෙපාර්තමේන්තුවට ගෙන්වන ලද අතර, වැඩි වශයෙන් විශ්‍රාම වැටුප් අයදුම්පත් එවනු ලබන ආයතන හඳුනාගෙන එම ආයතන සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් ආයතන වලට ගොස් දැනුවත් කිරීම් කරන ලදී.

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ නවීන ආයතන සංස්කෘතියක් ඇතිකරලීමේ අභිලාෂය අනුව දෙපාර්තමේන්තුවේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සිටින සියලුම මාණ්ඩලික, මාණ්ඩලික නොවන හා සුළු සේවකයන්, රියදුරන් සම්බන්ධ කරගෙන OBT පුහුණුවක් කැලණිය, වෙදමුල්ල විශ්‍රාමික නිවාඩු නිකේතනයේදී පවත්වන ලදී.

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු ක්‍රියාවලියේ යාවත්කාලීන කිරීම හා නවීන තාක්ෂණය හා නවීන තත්ත්වයන් ආයතනයට අවශෝෂණය කිරීම ඉලක්ක කරගෙන මැලේසියාවේ Post Service Department හි කාර්යයන් අධ්‍යයනය කිරීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් 04ක්ද, විශ්‍රාම වැටුප් නිලධාරීන් 12ක්ද විදේශ පුහුණුවට සහභාගී කරවන ලදී.

## 2014 වර්ෂයේ සිදු කරන ලද පුහුණු පාඨමාලා

| ස්ථානය | තනතුරු | පළාත | දිනය |
|---|---|---|---|
| විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු ශ්‍රවනාගාරය | සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල ගණකාධිකාරීවරුන් | සියළුම දිස්ත්‍රික්ක | 2014.05.19 |
| විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු ශ්‍රවනාගාරය | විශ්‍රාම වැටුප් නිලධාරී | බස්නාහිර පළාත | 2014.05.26 |
| අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | විශ්‍රාම වැටුප් නිලධාරී | උතුරුමැද පළාත | 2014.05.29 |
| 1. මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය<br>2. මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය<br>3. යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | විශ්‍රාම වැටුප් නිලධාරී<br>විශ්‍රාම වැටුප් නිලධාරී<br>විශ්‍රාම වැටුප් නිලධාරී | උතුරු පළාත | 2014.05.30<br>2014.06.05<br>2014.06.06 |
| රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | විශ්‍රාම වැටුප් නිලධාරී | සබරගමු පළාත | 2014.06.02 |
| බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | විශ්‍රාම වැටුප් නිලධාරී | ඌව පළාත | 2014.06.03 |
| මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | විශ්‍රාම වැටුප් නිලධාරී | දකුණු පළාත | 2014.06.09 |
| 1. අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය<br>2. ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | විශ්‍රාම වැටුප් නිලධාරී<br>විශ්‍රාම වැටුප් නිලධාරී | නැගෙනහිර පළාත | 2014.06.10<br>2014.06.17/2014.06.18 |
| මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | විශ්‍රාම වැටුප් නිලධාරී | මධ්‍යම පළාත | 2014.06.13 |

වගුව 02. 2014 වර්ෂයේ සිදු කරන ලද පුහුණු පාඨමාලා

මූලාශ්‍රය - පාලන හා පුහුණු අංශය

# 5. ප්‍රතිපත්ති හා නීති අංශය

විශ්‍රාම වැටුප් ප්‍රදානය හා ගෙවීම් ක්‍රියාවලිය කඩිනමින් හා කාර්යක්ෂමව කරගෙන යාමේ දී අදාල වන නීති රෙගුලාසි සම්පාදනය කිරීම මූලික කාර්යකි. මෙසේ සම්පාදනය කරනු ලබන නීතිරීති විශ්‍රාම වැටුප් සමඟ ජාලගත වී ඇති සියලුම ආයතන වෙත දන්වා යැවීම සිදුවේ. තවද නෛතික ගැටළු පැන නඟින අවස්ථාවලදී නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය පවත්වා ගනිමින් අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම සහ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වග උත්තරකරු කරමින් ඉදිරිපත් වී ඇති අධිකරණ ක්‍රියාමාර්ගවලදී අවශ්‍ය නීති උපදෙස් සහ නිරීක්ෂණ ලබා දෙමින් දෙපාර්තමේන්තුව නියෝජනය කිරීම ද විශ්‍රාම වැටුප් ගෙවීම/ විශ්‍රාම වැටුප් හිමිකම ප්‍රදානය කිරීමේ දී ආයතන මට්ටමින් හා පුද්ගල මට්ටමින් විමසීම කරනු ලබන විමසීම් සඳහා අදාල උපදෙස් නිකුත් කිරීම මෙම අංශයෙන් සිදු කෙරේ.

**2014 වර්ෂයේ නිකුත් කර ඇති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ**

| නිකුත් කළ දිනය | චක්‍රලේඛ අංකය | කාරණය |
|---|---|---|
| 2014-01-10 | 01/2014 | 2014 අයවැය යෝජනා අනුව ජීවන වියදම් දීමනා සංශෝධනය කිරීම |
| 2014-02-20 | 02/2014 | ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් මියගිය සහ අතුරුදහන් වූ පොලිස් නිලධාරීන්ගේ යැපෙන්නන් වෙත යැපෙන්නන්ගේ දීමනාව ගෙවීම |
| 2014-03-25 | 03/2014 | වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප්ක්‍රමය සඳහා මනාපය පල කිරීම/වැන්දඹුපුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් පනතේසංශෝධන ක්‍රියාත්මක කිරීම |
| 2014-03-26 | 04/2014 | විශ්‍රාම ලබන රාජ්‍ය සේවකයින් සඳහා පාරිතෝෂික ගෙවීම් කඩිනම් කිරීම |
| 2014-04-07 | 01/2011 (සංශෝධන I) | මාසික විශ්‍රාම වැටුප් ගෙවීම හා හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම විධිමත් කිරීම |
| 2014-04-07 | 07/2010 (II) | විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා වාරික වශයෙන් අයකිරීමේ පදනම මතදඹදිව වන්දනාව සඳහා ගුවන් ටිකට්පත් ලබාදීම - මිහින් ලංකා ගුවන් සමාගම |
| 2014-05-02 | 04/2014 (සංශෝධන I) | විශ්‍රාම ලබන රාජ්‍ය සේවකයින් සඳහා පාරිතෝෂික ගෙවීම කඩිනම් කිරීම |
| 2014-06-19 | 05/2014 | විශ්‍රාම ලබන රාජ්‍ය සේවකයින් සඳහා පාරිතෝෂික ගෙවීම කඩිනම් කිරීම |
| 2014-06-23 | 06/2014 | හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම නතර කිරීම |

| | | |
|---|---|---|
| 2014-07-03 | 06/2014 (I) | හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම නතර කිරීම |
| 2014-07-03 | 07/2014 | විශ්‍රාම ලබන රාජ්‍ය සේවකයින් සඳහා පාරිතෝෂික ගෙවීම කඩිනම් කිරීම |
| 2014-07-04 | 08/2014 | විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පුරවැසි රැකවරණය සඳහා "බුහුමන්" රක්ෂණ සැලසුම ක්‍රියාත්මක කිරීම |
| 2014-07-15 | 06/2014 (II) | හිග විශ්‍රාම වැටුප් ගෙවීම නතර කිරීම |
| 2014-07-25 | | විශ්‍රාමික ප්‍රජාවගේ ආර්ථික ප්‍රවර්ධනය සඳහා ණය පහසුකම් සැපයීම |
| 2014-08-07 | 09/2014 | බැංකු මගින් විශ්‍රාම වැටුප් ලබාගත් විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් තාවකාලිකව නතර කරන අවස්ථා වලදී නැවත එය ගෙවීම සිදුකළ යුතු අකාරය |
| 2014-08-07 | 10/2014 | විශ්‍රාම ලබන රාජ්‍ය සේවකයින් සඳහා පාරිතෝෂික ගෙවීම කඩිනම් කිරීම |
| 2014-08-21 | | විශ්‍රාමික ප්‍රජාවගේ ආර්ථික ප්‍රවර්ධනය සඳහා ණය පහසුකම් සැපයීම |
| 2014-08-26 | 11/2014 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විශ්‍රාම වැටුප් ගෙවීම සරල කිරීමේ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම |
| 2014-09-17 | 02/2014 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විශ්‍රාම වැටුප් ගෙවීම සරල කිරීමේ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම |
| 2014-09-19 | 03/2014 | සන්නද්ධ සේවා වැන්දඹු විශ්‍රාම වැටුප් පිළිබඳ තොරතුරු ලබා ගැනීම |
| 2014-10-15 | | 2014 අයවැය යෝජනා ක්‍රියාත්මත කිරීම - යතුරුපැදි ලබා දීම |

වගුව 03 - 2014 වර්ෂයේ නිකුත් කර ඇති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ

මූලාශ්‍රය - ප්‍රතිපත්ති අංශය

## 6. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල

1942 අංක 18 දරන පනතින් ස්ථාපිත මෙම අරමුදලින් මාසික වැටුප් ලබන ස්ථිර හා විශ්‍රාම වැටුප් රහිත රාජ්‍ය සේවකයන් සඳහා සේවා අවසාන මූල්‍ය ප්‍රතිලාභ සහිතව ආරම්භ කරන ලද 2003 අංක 17 දරණ සංශෝධන මඟින් අරමුදලේ අරමුණු හා පරමාර්ථ තවදුරටත් පුළුල් කරන ලදි. අරමුදලේ පාලනය පංච පුද්ගල මණ්ඩලයක් මඟින් සිදු කරයි.

| විස්තරය | සාමාජිකයන් ප්‍රමාණය |
|---|---|
| අලුතින් බඳවා ගත් ප්‍රමාණය | 8912 |
| වසර තුල ක්‍රියාකාරී සාමාජිකයන් ගණන | 68500 |
| වසර තුල ක්‍රියාකාරී නොවුන සාමාජිකයන් ගණන | 162,337 |
| 2014.12.31 දිනට මුළු සාමාජිකයන් ප්‍රමාණය | 239749 |

වගුව 04 - සාමාජිකයන් ප්‍රමාණය

මූලාශ්‍රය - රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල

| වර්ගය | විශ්‍රාමිකයන් ප්‍රමාණය | වියදම |
|---|---|---|
| රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදල | 4912 | 390,680,560.68 |

වගුව 05 - විශ්‍රාමිකයන් ප්‍රමාණය හා වියදම

මූලාශ්‍රය - රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල

| වර්ගය | 2014 |
|---|---|
| මුළු විශ්‍රාමිකයන් ගණන | 4912 |
| ගෙවන ලද මුළු ප්‍රමාණය (රු.) | 4,496,104,668.84 |

වගුව 06 - මුළු විශ්‍රාමිකයන් ගණන සහ ගෙවන ලද මුළු ප්‍රමාණය

මූලාශ්‍රය - රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල

## 7. අභ්‍යන්තර විගණන අංශය

රාජ්‍ය නිලධාරින් විශ්‍රාම වැටුප් පිළිබඳ ප්‍රතිපත්ති සකස් කිරීම හා ඒවා කාර්යක්ෂමව ඉදිරිපත් කිරීම මඟින් රාජ්‍ය සේවකයින්ට කලත්‍රයන්ට හා යැපෙන්නන්ට අනාගත ආරක්ෂාව සැලසීම මෙන්ම සුභ සිද්ධිය සහතික කිරීම යන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා කළමනාකරණයට සහය වීම විගණනයේ අරමුණ වේ. මෙම අරමුණ ඉටු කර ගැනීම සඳහා ආයතනික හා මූල්‍ය පද්ධතීන්, ක්‍රමවේදයන් නිසි ආකාරව අනුගමනය කරමින් සම්පත් උපරිම අයුරින් යොදවන බවට තහවුරු කර ගැනීම හා අමාත්‍යංශ දෙපාර්තමේන්තු චක්‍ර ලේඛවලට අනුකූලව විශ්‍රාම වැටුප හා පාරිතෝෂික ගෙවීම් සිදු කිරීමේ දී විශ්‍රාමිකයන්ට ඔවුන්ගේ කාලාත්‍රයන්ට හා යැපෙන්නන්ට ප්‍රතිලාභ ලැබෙන බවට සහතික වීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල, අමාත්‍යංශ, දෙපාර්තමේන්තුව හා පළාත් පාලන ආයතන විගණනයට ලක් කිරීම අභ්‍යන්තර විගණනයේ කාර්යභාරය වේ.

**2014 වර්ෂයේ ක්‍රියාකාරකම්**

| කාර්යය | ප්‍රගතිය |
|---|---|
| 2014 වර්ෂය තුල විගණනයට ලක් වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල | 46 |
| පළාත් පාලන ආයතන හා වෙනත් දෙපාර්තමේන්තු | 02 |
| විශේෂ පරීක්ෂණ | 15 |
| රජයේ විගණකාධිපති විගණන විමසුම් සංඛ්‍යාව | 28 |
| මහජන පැමිණිලි හා පෙත්සම් පරීක්ෂාව ප්‍රාදේශීය සභා ලේකම් කාර්යාල වල ගැටළු නිරාකරණය කිරීම සඳහා ලබා ගත් ලිපිගොනු සංඛ්‍යාව | 156 |
| ලිපි ගොනු ගෙන්වා ගැනීමට අවශ්‍ය නොවූ මහජන පැමිණිලි | 233 |

වගුව 07 - 2014 වර්ෂයේ ක්‍රියාකාරකම්
මූලාශ්‍රය - අභ්‍යන්තර විගණන අංශය

**2014 වර්ෂයේ ප්‍රගතිය**

| කාර්යය | ප්‍රගතිය |
|---|---|
| යොමු කරන ලද අභ්‍යන්තර විගණන විමසුම් සංඛ්‍යාව | 46 |
| පිළිතුරු සකස් කරන ලද රජයේ විගණන විමසුම් සංඛ්‍යාව | 22 |
| කටයුතු අවසන් කරන ලද ලිපිගොනු සංඛ්‍යාව | 156 |
| පිළිතුරු යවන ලද මහජන පැමිණිලි සංඛ්‍යාව | 233 |
| අනාවරණය කරගත් ද්විත්ව ගෙවීම් | 12 |
| අනාවරණය කර ගනු ලැබූ වංචා | 04 |

වගුව 08 - 2014 වර්ෂයේ ප්‍රගතිය
මූලාශ්‍රය - අභ්‍යන්තර විගණන අංශය

## 8. ගිණුම් අංශය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ මූල්‍ය සම්පත් වඩා කාර්යක්ෂම හා ඵලදායී අයුරින් පවත්වා ගෙන යාම සඳහා විධිමත් වූ ක්‍රමවේදයන් අනුගමනය කරමින් ආයතන අරමුණු ඉටු කර ගැනීම සඳහා දායකත්වය සැපයීම මෙම අංශය මඟින් සිදු කරයි.

### 8.1 පුනරාවර්තන වියදම් නිසි කළමනාකරණය තුලින් ඵලදායී ප්‍රාග්ධන වියදම් වැඩි කර ගැනීමට කටයුතු කිරීම.

| 2014 වර්ෂයේ පුනරාවර්තන වියදම් (රු.) | |
|---|---|
| තැපැල් හා සන්නිවේදන වියදම් | 8,811,146.00 |
| විදුලිය හා ජලය | 12,998,497.00 |
| වාහන නඩත්තු | 1,396,120.00 |
| යන්ත්‍ර නඩත්තු | 1,487,265.00 |
| ලිපි ද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 11,962,991.00 |
| ඉන්ධන | 3,399,851.00 |
| පුද්ගල පඩිනඩි හා දීමනා | 347,149,366.00 |
| විශ්‍රාම වැටුප් ගෙවීම | 126,135,826,037.00 |

වගුව 09 - 2014 වර්ෂයේ ප්‍රගතිය
මූලාශ්‍රය - ගිණුම් අංශය

| **2014 වර්ෂයේ මූලධන වියදම් (රු.)** | |
|---|---|
| ගොඩනැඟිලි හා ඉදි කිරීම් | 20,992,596.00 |
| නඩත්තු හා පුනුරුත්තාපනය (2001)<br>ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ<br>මිලදී ගැනීම (2102) | 1,996,928.00<br>5,154,938.00<br>7,151,866.00 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ (2103) | 62,299,951.00 |
| ගොඩනැඟිලි හා ඉදි කිරීම් (2104) | 1,500,000.00 |
| පුහුණු හා සංවර්ධන වියදම් | 1,349,783.00<br>850,411.00<br>2,200,194.00 |

වගුව 10 - 2014 වර්ෂයේ මූලධන වියදම්
මූලාශ්‍රය - ගිණුම් අංශය

### 8.2 2014 වර්ෂයේ මූල්‍ය තොරතුරු හා ප්‍රගතිය

2014 වසර සඳහා වාර්ෂික ඇස්තමේන්තු වලින් වෙන්වී ඇති මුළු ප්‍රතිපාදන ව්‍යාපෘතියට අනුව බෙදී ඇති ආකාරය පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| සාමාන්‍ය පරිපාලනය | - රු. | 162,202,799.00 |
| විශ්‍රාම වැටුප් ක්‍රියාත්මක කිරීම | - රු. | 147,061,460,091.00 |
| | - රු. | 147,223,662,890.00 |


ඉහත ප්‍රතිපාදන මූල්‍යකරණය කරනුයේ,

| | | |
|---|---|---|
| දේශීය අරමුදල් මඟින් (11) | - රු. | 126 024,142,890.00 |
| විශේෂ නීති සේවා (21) | - රු. | 21,199,520,000.00 |
| | - රු. | 147,223,662,890.00 |


| | වෙන් කරන ලද ප්‍රතිපාදන (රු.මිලියන) | වියදම (රු. මිලියන) | වියදම ප්‍රතිපාදනයේ % ලෙස |
|---|---|---|---|
| ආබාධිත සෙබළුන්ගේ සමාජ ආරක්ෂණ කටයුතු | 18243.8 | 18243.8 | 100% |
| රජයේ නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් පාරිතෝෂික හා අනෙකුත් ගෙවීම් | 127,458.6 | 126,135.4 | 98% |
| රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ප්‍රසාද දීමනා වෙනුවෙන් | 999.5 | 913.5 | 91% |

වගුව 11 - 2014 වර්ෂයේ මූල්‍ය තොරතුරු හා ප්‍රගතිය

මූලාශ්‍රය - ගිණුම් අංශය




ප්‍රස්තාර 12 - අයවැය ඇස්තමේන්තුව
මූලාශ්‍රය - ගිණුම් අංශය





ප්‍රස්තාර 13 - විශ්‍රාම වැටුප් වියදම
මූලාශ්‍රය - ගිණුම් අංශය

## 9. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව තුල විශ්‍රාමිකයන් සඳහා 2014 වර්ෂය තුල සිදු කරන ලද වෙනස්කම්

2013 වසරේ විශ්‍රාම වැටුපෙන් ඔබ්බට දියත් කල වැඩසටහන් තවදුරටත් යාවත්කාලීන කරන අතරම නව මානයක් කරා යොමු වෙමින් විශ්‍රාමික ප්‍රජාව වෙත වඩාත් සාධනීය වූ සේවාවන් සැපයීමට 2014 වසර තුල හැකි වී ඇත. ඒ අනුව 2013 වසරේ දී අරඹන ලද විශ්‍රාමික ප්‍රජාව සඳහා ණය පහසුකම් ලබා දීම තවත් පුළුල් කරමින් ග්‍රාමීය සංවර්ධන බැංකුව සහ සණස සංවර්ධන බැංකුව ද බැංකු ජාලයට එක් කර ගැනීමට හැකි විය. එමෙන්ම වයස අවුරුදු 60 ඉක්මවූ පුරවැසියන් වෙත ඉලක්ක ගතව නොතිබූ රක්ෂණ ක්‍රමයන් අබිබවා යමින් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙත බුහුමන් නමින් රක්ෂණාවරණයක් හඳුන්වා දී රක්ෂණ ක්ෂේත්‍රය තුල ද නව ව්‍යාපාරික ප්‍රවනතා බිහි කරමින් දේශීය ආර්ථික සංවර්ධනය කෙරෙහි දායක වීමට හැකි විය.

සෘජුවම විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය ප්‍රතිසංවිධාන ගත කරමින් ප්‍රමාදයකින් හා බාධාවකින් තොරව කඩිනමින් විශ්‍රාම ප්‍රතිලාභ ලබා ගැනීමට විශ්‍රාමිකයන්ට අවස්ථාව සලසා දීමට හැකි වී ඇත. එහි දී විශ්‍රාමික පාරිතෝෂික මුදල් සෘජුවම විශ්‍රාමිකයාගේ පෞද්ගලික ගිණුමට බැර කිරීමත් අයවීම් වෙතොත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් අදාල අංශ වෙත යොමු කිරීමත් මඟින් පාරිතෝෂික ගෙවීම් කඩිනම් වීම මෙන්ම සරලකරණයක් ද සිදු විය. එමෙන්ම ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ගෙවමින් තිබූ විශ්‍රාම වැටුප් හිඟ මුදල් ගෙවීම සඳහා මධ්‍යගත ගෙවීම් ක්‍රමයක් හඳුන්වා දෙමින් විශ්‍රාම වැටුප් දෙපාර්තාමේන්තුව මඟින් සියලු හිඟ මුදල් ගෙවීම සඳහා කටයුතු කෙරුණි. ඒ මඟින් සිදුවිය හැකිව තිබූ මුදල් අවභාවිතයන් වළක්වා ගැනීමට හැකි විය.




ප්‍රස්තාර 14 - විශ්‍රාමික ණය ලබා දීම මූල්‍ය ආයතන අනුව 2014
මූලාශ්‍රය - ගිණුම් අංශය

එමෙන්ම ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ක්‍රියාත්මක වූ පළමු විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රමය නිසා විශ්‍රාමික ප්‍රජාවට බොහෝවිට මාසයක පමණ කලක සිට වසර දෙකක් පමණ කාලයක් මාසික විශ්‍රාම වැටුප් ලබා ගැනීමට කාලයක් ගතව ඇතිබව අනාවරණය විය. එහිදී විශ්‍රාම ප්‍රජාව අත්විදි දුෂ්කරතායත් හිඟ මුදල් ගෙවීමේදී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විඳි දුෂ්කරතාවයත් සැලකිල්ලට ගෙන රාජ්‍ය සේවකයා ලැබූ දිනෙන් පසු එළඹෙන මාසයේදීම ප්‍රථම මාසික ගෙවීම් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් ආරම්භ කිරීමේ නව ක්‍රමවේදයක් 2014-10-01 සිට හඳුන්වා දීමට හැකි විය. ඒ මඟින් උක්ත ගැටලු විසඳා ගැනීමට හැකියාව ලැබුණි. එමෙන්ම එක් මාසික විශ්‍රාම වැටුප් සෘජුවම විශ්‍රාමිකයාගේ ගිණුම ප්‍රධාන ශාඛාව වෙත බැර කිරීම මඟින් ආයතනයක් වශයෙන් ද ගෙවීම් සරල කිරිමට හැකියාව ලැබුණි.

එසේම එමඟින් භාණ්ඩාගාරය හරහා සිදුවන රාජ්‍ය මූල්‍ය කළමනාකරණය ශක්තිමත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට හැකියාව ලැබුණි. මුදල් ගෙවීමේ ක්‍රියාවලිය සරල හා විනිවිදභාවයකින් යුතුව කිරිමට හැකියාව ලැබීමෙන් මුදල් අවභාවිතය මෙන්ම ශ්‍රී ලංකාවේ විශ්‍රාම වැටුප් ගෙවීම සෘජුවම බැංකු වලට යැවීම තුලින් ශ්‍රම පිරිවැය අවම වීම, ඒ සඳහා ගතවෙන පැය ගණන සීමා වීම, වියදම් අවම වීම තුලින් බැංකු සහ දෙපාර්තමේන්තුවේ පිරිවැය අඩුවී ඉතුරුම් ඉහල යාම වැනි වාසි රැසක් ලබා ගැනීමට හැකිවුණි. පාරිතෝෂික බැංකුව වෙත යැවීමෙන් කාලය හා පිරිවැය අවම වීම, එම ක්‍රියාවලිය අවම වීම සහ මුදල් සංසරණය අඩු වීම වැනි වාසි ඇති බැවින් දෙපාර්තමේන්තු ක්‍රියාවලිය ශක්තිමත් වී ඇත.

## 10. ජාතික විශ්‍රාමික දිනය - 2014

සමස්ත විශ්‍රාමික ප්‍රජාවගේ විශ්‍රාමික දිවිය සුරක්ෂිත කිරීම හා ඔවුන්ගේ දායකත්වය තිරසාර හා ඵලදායීව යොදා ගැනීම තහවුරු කිරීම සඳහා විශ්‍රාමික දිනය සෑම වසරකම ඔක්තෝම්බර් 08 දිනය සමරනු ලබයි.

2014 වර්ෂයේ විශ්‍රාමික දිනයේ විශ්‍රාමිකයන් සඳහා වූ විශේෂ වැඩසටහන්

1. වෛද්‍ය නවාස් ජිෆ්රි මහතාගේ දේශනය
2. අජිත් නිවාඩ් කබ්රාල් මහතාගේ දේශනය
3. විශ්‍රාමිකයන් සඳහා සංකලන නිර්මාණ ග්‍රන්ථය දොරට වැඩීම.
4. Pan Asia බැංකුව මඟින් ණය වැඩසටහන් හඳුන්වා දීම.
5. මිහින් ලංකා ආයතනය මඟින් දඹදිව වන්දනා සඳහා ගුවන් ටිකට්පත් නිකුත් කිරීම.

10.1 ජාතික විශ්‍රාමික දිනයට සමගාමීව පහත සඳහන් සේවා කිහිපයක් හඳුන්වා දෙන ලදි.ඒවා නම්

- Mobitel M Cash ක්‍රමය හඳුන්වා දීම.
- විශ්‍රාමිකයන් සඳහා නව හැඳුනුම්පත (Smart ID) හඳුන්වා දීම.
- විශේෂිත ජංගම දුරකථන හා අන්තර්ජාල පැකේජය විශ්‍රාමිකයින්ට හඳුන්වා දීම.
- බුහුමන් රක්ෂණ ආවරණ හඳුන්වා දීම.





## 11. රම්බොඩ නිවාඩු නිකේතනය

පන්ලක්ෂ පනස් දහසක් පමණ වූ විශ්‍රාමික ප්‍රජාවකගේ විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම නියාමනය කිරීමෙන් ඔබ්බට යමින් ඔවුන්ගේ විශ්‍රාම සුවය තවදුරටත් වින්දනය කරමින් මනස්කාන්ත රම්බොඩ දියඇල්ල අද්දර ඉදි වූ රම්බොඩ නිවාඩු නිකේතනය 2014/06/20 දින විශ්‍රාමික ප්‍රජාව වෙත විවෘත විය. රාජ්‍ය සේවයන් සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සිදු කළ තවත් සත්කාරයක් ලෙස මෙය හඳුන්වා දිය හැකිය.ගම්පොළ නුවරඑළිය මාර්ගයේ රම්බොඩ උමං මාර්ගයට යාබදව රම්බොඩ දියඇල්ල අසල උස් බිමක පිහිටා ඇති මෙම නිවාඩු නිකේතනය සියලු විශ්‍රාමික ප්‍රජාවට හා රාජ්‍ය සේවක ප්‍රජාවට විවෘත විය. මෙසේ සිදුවන සංචාරක ආගමනයන්හිදී ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල්වල අය පවත්වා ගෙන යන කිතුල් හකුරු, කිතුල් පැණි, නැවුම් කිරි නිෂ්පාදිත කර්මාන්ත දියුණු වීමක් ද වක්‍ර මාර්ගයෙන් මෙරට සංවර්ධනයට දායකත්වය සපයනු ලබයි.





## 12. කැලණිය වෙදමුල්ල නිවාඩු නිකේතනය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන කැලණිය වෙදමුල්ල නිවාඩු නිකේතනය විශේෂයෙන්ම විශ්‍රාමික ප්‍රජාවට පහසුකම් සැලසීම මූලික අරමුණු කරගෙන ආරම්භ කරන ලද අතර සමස්ථ රාජ්‍ය සේවකයින්ට මෙන් ම සාමාන්‍ය මහජනතාවට ද මෙම නිවාඩු නිකේතනය මිල කළ නොහැකි සම්පතකි. 2014 වසර මුල් කාලය වන විට විශාල ලෙස අවභාවිතයට පත්ව තිබූ මෙම නිවාඩු නිකේතනය, 2014 වසර තුල සිදු කරන ලද අළුත්වැඩියා කටයුතු වලින් පසු නැවත ප්‍රකෘති තත්වයට පත් කරලීමට හැකි විය. අංගසම්පූර්ණ ශ්‍රවනාගාරයකින් හා කුඩා සම්මන්ත්‍රණ ශාලාවකින් සමන්විත වන මෙම නිවාඩු නිකේතනය සඳහා රාජ්‍ය අංශයේ මෙන් ම පෞද්ගලික ආයතන වලින් ද විශාල ඉල්ලුමක් පැවතුනි. විශ්‍රාමික ප්‍රජාව සඳහා ඉතාමත් අඩු මුදලකට නේවාසික පහසුකම් සපයනු ලැබීම නිසා විශ්‍රාමික ප්‍රජාව අතර මෙම නිවාඩු නිකේතනය මහත් ප්‍රසාදයට ලක්විය. නේවාසික පහසුකම් සැපයීම සඳහා අංගසම්පූර්ණ නේවාසික කුටි, නේවාසිකාගාර හා නේවාසික කාමර වලින් මෙම නිවාඩු නිකේතනය සමන්විත වේ.





ඩී.ජී.එස්.ඒ - 1

# විසර්ජන ගිණුම 2014

**වියදම් ශීර්ෂ අංකය : 253** **දෙපාර්තමේන්තුවේ නම : විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව**

| වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් පරිදි වැඩසටහන් අංකය | වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් පරිදි වැඩසටහනෙහි නම | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මු.රෙ. 66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ ඉක්මවීම (4-5) | පිටු අංකය (අදාළ ඩී.ජී.එස්.ඒ 2 ආකෘතියට අනුව) |
|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| 1 | පුනරාවර්තන<br>මෙහෙයුම් වැඩසටහන | 146,913,595,000 | 283,792,890 | -69,250,412 | 147,128,137,478 | 145,718,146,852 | 1,409,990,626 | ඩී.ජී.එස්.ඒ - 3 |
| | උප එකතුව (පුනරාවර්තන) | **146,913,595,000** | **283,792,890** | **-69,250,412** | **147,128,137,478** | **145,718,146,852** | **1,409,990,626** | |
| 1 | මූලධන<br>මෙහෙයුම් වැඩසටහන | 26,275,000 | 0 | 69,250,412 | 95,525,412 | 94,756,190 | 769,222 | ඩී.ජී.එස්.ඒ - 4 |
| | උප එකතුව (මූලධන) | **26,275,000** | **0** | **69,250,412** | **95,525,412** | **94,756,190** | **769,222** | |
| | මුළු එකතුව | **146,939,870,000** | **283,792,890** | **0** | **147,223,662,890** | **145,812,903,042** | **1,410,759,848** | |

පිටු අංක 2 සිට 30 දක්වා ඩී.ජී.එස්.ඒ 2 සිට ඩී.ජී.එස්.ඒ 10 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් අංක 31 සිට 41 දක්වා ඇතුළත් අනෙකුත් විස්තර ද මෙම විසර්ජන ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. එබැවින් ඉහත ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් තොරතුරු හා සටහන්වලට අනුකූලව පිළියෙල කර බවත්, භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ අදාළ ගිණුම් සැසඳීම් කර ඇති බවත්, ඒවා නිවැරදි බවට තහවුරු වී ඇති බවත් මෙයින් සහතික කරමි.

| | | |
|---|---|---|
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන ගණකාධිකාරි |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | තනතුර : |
| දිනය : 2015.03 | දිනය : 2015.03 | දිනය : 2015.03 |

ඩී.ජී.එස්.ඒ - 2

# වැඩසටහන් අනුව විසර්ජන ගිණුම - 2014

වියදම් ශීර්ෂ අංකය : 253 දෙපාර්තමේන්තුවේ නම : විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

වැඩසටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් වැඩසටහන

## පුනරාවර්තන හා මූලධන වියදම් සාරාංශය

| වියදමෙහි ස්වභාවය (ඩී.ජී.එස්.ඒ ආකෘති යොමුව සමඟ) | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මු.රෙ 66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ ඉක්මවීම (4-5) | පිටු අංකය (අදාළ ඩී.ජී.එස්.ඒ ආකෘතියට අනුව) |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| (අ) පුනරාවර්තන (ඩී.ජී.එස්.ඒ. 3) | 146,913,595,000 | 283,792,890 | -69,250,412 | 147,128,137,478 | 145,718,146,852 | 1,409,990,626 | ඩී.ජී.එස්.ඒ - 3 |
| (ආ) මූලධන (ඩී.ජී.එස්.ඒ. 4) | 26,275,000 | 0 | 69,250,412 | 95,525,412 | 94,756,190 | 769,222 | ඩී.ජී.එස්.ඒ - 4 |
| එකතුව | **146,939,870,000** | **283,792,890** | **0** | **147,223,662,890** | **145,812,903,042** | **1,410,759,848** | |

ප්‍රධාන ගණකාධිකාරි

දිනය:- 2015.03.

ඩී.ජී.එස්.ඒ - 3

# ව්‍යාපෘති අනුව පුනරාවර්තන වියදම්

වියදම් ශීර්ෂ අංකය : 253 දෙපාර්තමේන්තුවේ නම : විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

වැඩසටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් වැඩසටහන

| ව්‍යාපෘති අංකය / නම, පුද්ගලික පඩිනඩි සහ සියළුම ව්‍යාපෘති සඳහා අනෙකුත් වියදම් | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මු.රෙ.66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | (5) මුළු වියදම් | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය (4-5) |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **01. සාමාන්‍ය පරිපාලනය** | | | | | | |
| පුද්ගල පඩිනඩි | 33,200,000 | 0 | -4,722,917 | 28,477,083 | 28,020,455 | 456,628 |
| අනෙකුත් වියදම් | 40,100,000 | 0 | 6,175,716 | 46,275,716 | 46,061,886 | 213,830 |
| උප එකතුව | **73,300,000** | **0** | **1,452,799** | **74,752,799** | **74,082,341** | **670,458** |
| **02. විශ්‍රාම වැටුප් ක්‍රියාත්මක කිරීම** | | | | | | |
| පුද්ගල පඩිනඩි | 311,000,000 | 0 | 8,495,961 | 319,495,961 | 319,128,911 | 367,050 |
| අනෙකුත් වියදම් | 146,529,295,000 | 283,792,890 | -79,199,172 | 146,733,888,718 | 145,324,935,600 | 1,408,953,118 |
| උප එකතුව | 146,840,295,000 | 283,792,890 | -70,703,211 | 147,053,384,679 | 145,644,064,511 | 1,409,320,168 |
| මුළු එකතුව | **146,913,595,000** | **283,792,890** | **-69,250,412** | **147,128,137,478** | **145,718,146,852** | **1,409,990,626** |

ප්‍රධාන ගණකාධිකාරි

දිනය:- 2015.03.

ඩී.ජී.එස්.ඒ - 4

# ව්‍යාපෘති අනුව මූලධන වියදම්

වියදම් ශීර්ෂ අංකය : 253 දෙපාර්තමේන්තුවේ නම : විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

වැඩසටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් වැඩසටහන

| වැය විෂය අංකය | අයිතම් අංකය | මූල්‍යකරණය (සංකේත අංකය) | අයිතම් විස්තරය | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | (2) මු.රෙ.66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම්, පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | (3) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2) | (4) මුළු වියදම | (5) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය (3-4) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රු. | රු. | රු. | රු. | රු. |
| | | | **01. සාමාන්‍ය පරිපාලනය හා ආයතන සේවා** | | | | | |
| | | | **මූලධන වත්කම් පුනරු. හා වැඩි දියුණු කිරීම** | | | | | |
| 2001 | | 11 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 11,500,000 | 9,500,000 | 21,000,000 | 20,992,596 | 7,404 |
| 2002 | | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 800,000 | -700,000 | 100,000 | 93,219 | 6,781 |
| 2003 | | 11 | වාහන | 0 | 0 | 0 | 0 | 0 |
| | | | **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | | | | | |
| 2102 | | 11 | ගෘහ භාණ්ඩ හා කාර්යාලයීය උපකරණ | 2,000,000 | 0 | 2,000,000 | 1,996,928 | 3,072 |
| 2103 | | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 3,000,000 | 60,000,000 | 63,000,000 | 62,299,951 | 700,049 |
| | | | **මානව සම්පත් සංවර්ධනය** | | | | | |
| 2401 | | 11 | කාර්ය මණ්ඩල පුහුණුව | 750,000 | 600,000 | 1,350,000 | 1,349,783 | 217 |
| | | | | **18,050,000** | **69,400,000** | **87,450,000** | **86,732,477** | **717,523** |

ඩී.ජී.එස්.ඒ - 4

# ව්‍යාපෘති අනුව මූලධන වියදම්

වියදම් ශීර්ෂ අංකය : 253 දෙපාර්තමේන්තුවේ නම : විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

වැඩසටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් වැඩසටහන

| වැය විෂය අංකය | අයිතම් අංකය | මූල්‍යාකරණය (සංකේත අංකය) | අයිතම් විස්තරය | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | (2) මු.රෙ.66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම්, පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | (3) මුළු ශුද්ධ වෙන් කිරීම් (1+2) | (4) මුළු වියදම | (5) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය (3-4) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | රු. | රු. | රු. | රු. | රු. |
| | | | **02. විශ්‍රාම වැටුප් ක්‍රියාත්මක කිරීම** | | | | | |
| | | | මූලධන වත්කම් පුනරු. හා වැඩි දියුණු කිරීම | | | | | |
| 2002 | | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 775,000 | -250,000 | 525,000 | 518,364 | 6,636 |
| | | | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | | | | | |
| 2102 | | 11 | ගෘහ භාණ්ඩ හා කාර්යාලයීය උපකරණ | 5,200,000 | 0 | 5,200,000 | 5,154,938 | 45,062 |
| 2104 | | 11 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 1,500,000 | 0 | 1,500,000 | 1,500,000 | 0 |
| | | | මානව සම්පත් සංවර්ධනය | | | | | |
| 2401 | | 11 | කාර්ය මණ්ඩල පුහුණුව | 750,000 | 100,412 | 850,412 | 850,411 | 1 |
| | | | | **8,225,000** | **-149,588** | **8,075,412** | **8,023,713** | **51,699** |
| | | | | **26,275,000** | **69,250,412** | **95,525,412** | **94,756,190** | **769,222** |

ප්‍රධාන ගණකාධිකාරි

දිනය:- 2015.03.

ඩී.ජී.එස්.ඒ -5

# වැඩසටහන් අනුව වියදම් මූල්‍යකරණ සාරාංශය

දෙපාර්තමේන්තුවේ නම : විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
වියදම් ශීර්ෂ අංකය : 253

| සංකේතය | මූල්‍යකරණය | වැඩසටහන 01 | | මුළු එකතුව | | |
|---|---|---|---|---|---|---|
| | සංකේත විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය 1 | සත්‍ය වියදම 2 | ශුද්ධ ප්‍රතිපාදනය 3 | සත්‍ය වියදම 4 | වියදමේ ප්‍රතිශතය (4÷3)X100 |
| | | රු. | රු. | රු. | රු. | % |
| 11 | දේශීය අරමුදල් | 126,024,142,890 | 126,022,140,432 | 126,024,142,890 | 126,022,140,432 | 100 |
| 12 | විදේශ ණය | | | | | |
| 13 | විදේශ ප්‍රදාන | | | | | |
| 14 | ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශ ණය | | | | | |
| 15 | ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශ ප්‍රදාන | | | | | |
| 16 | ප්‍රතිපාර්ශවීය අරමුදල් | | | | | |
| 17 | විදේශ මූල්‍යයන ආශ්‍රිත දේශීය පිරිවැය | | | | | |
| 21 | විශේෂ නිති සේවා | 21,199,520,000 | 19,790,762,610 | 21,199,520,000 | 19,790,762,610 | 93 |
| | එකතුව | 147,223,662,890 | 145,812,903,042 | 147,223,662,890 | 145,812,903,042 | 99 |

ප්‍රධාන ගණකාධිකාරි
දිනය:- 2015.03.

ඩී.ජී.එස්.ඒ - 5 (i)

# එක් එක් වැඩසටහනක ව්‍යාපෘති අනුව වියදම් මූල්‍යකරණය

(වැඩසටහනක ව්‍යාපෘති අනුව පුනරාවර්තන වියදම් හා මූලධන වියදම්වල මූල්‍යකරණය)

දෙපාර්තමේන්තුවේ නම : විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

වියදම් ශීර්ෂ අංකය : 253

වැඩසටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් වැඩසටහන

| සංකේතය | මූල්‍යකරණය | ව්‍යාපෘති 1 | | ව්‍යාපෘති 2 | | වැඩසටහනේ එකතුව | |
|---|---|---|---|---|---|---|---|
| | සංකේත විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 11 | දේශීය අරමුදල් | 162,202,799 | 160,814,818 | 125,861,940,091 | 125,861,325,614 | 126,024,142,890 | 126,022,140,432 |
| 12 | විදේශ ණය | | | | | | |
| 13 | විදේශ ප්‍රදාන | | | | | | |
| 14 | ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශ ණය | | | | | | |
| 15 | ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශ ප්‍රදාන | | | | | | |
| 16 | ප්‍රතිපාර්ශවීය අරමුදල් | | | | | | |
| 17 | විදේශ මූල්‍යයන ආශ්‍රිත දේශීය පිරිවැය | | | | | | |
| 21 | විශේෂ නීති සේවා | 0 | 0 | 21,199,520,000 | 19,790,762,610 | 21,199,520,000 | 19,790,762,610 |
| | **එකතුව** | **162,202,799** | **160,814,818** | **147,061,460,091** | **145,652,088,224** | **147,223,662,890** | **145,812,903,042** |

ප්‍රධාන ගණකාධිකාරි

දිනය:- 2015.03.

සටහන (ii)

# අත්තිකාරම් ගිණුම් සහ තැන්පත් ගිණුම් සඳහා වූ පාලන ගිණුම්වල සාරාංශය - 2014

**වියදම් ශීර්ෂ අංකය : 253** **දෙපාර්තමේන්තුවේ නම : විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව**

| අත්තිකාරම් / තැන්පත් ගිණුමේ නම | ගිණුම් අංකය | දෙපාර්තමේන්තු පොත් අනුව | | | | භාණ්ඩාගාර පොත් අනුව 2014/12/31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| | | 2014/01/01 දිනට ආරම්භක ශේෂය | වර්ෂය තුළ හර කිරීම් | වර්ෂය තුළ බැර කිරීම් | 2014/12/31 දිනට අවසාන ශේෂය | |
| | | රු. | රු. | රු. | රු. | රු. |
| I. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් | 25301 | 91,983,347.60 | 37,795,465.17 | 32,242,695.50 | 97,536,117.27 | 97,540,913.27 |
| II. අනෙකුත් අත්තිකාරම් | | | | | | |
| III. විවිධ අත්තිකාරම් | | | | | | |
| IV. තැන්පත් | | | | | | |
| (i) පොදු තැන්පත් | 6000/0/0/15/133 | 9,464,426.89 | 59,353,375.20 | 58,379,476.39 | 8,490,528.08 | 8,490,528.08 |
| (ii) අනෙකුත් තැන්පත් | | | | | | |

**මු.රෙ.506(2) ප්‍රකාර ඉහත සඳහන් අත්තිකාරම් ගිණුම්වල හා තැන්පත් ගිණුම්වල අවසාන ශේෂය, පුද්ගල ගිණුම්වල අදාළ ලැයිස්තු සමඟ සසඳා, එම සැසඳුම් ප්‍රකාශය විගණකාධිපති වෙත වාර්තා කළ බවට තහවුරු කරමි.**

රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අතර ඇති රු.4796/- ක වෙනසට අදාල වන හඳුනාගත නොහැකි හර ශේෂය රාජ්‍ය මුදල් චක්‍රලේඛ 369 හා මු.රෙ. 113 අනුව කපා හැරීමට ඉදිරිපත් කර ඇත.

ප්‍රධාන ගණකාධිකාරි
මුලකුරු සමඟ නම
දිනය 2015.03.